# ශ්‍යාම උපසම්පදාව තුළින් ඇති කළ සමාජ බලපෑම

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අජිත් තල්වත්ත

මහනුවර යුගයේ පූර්ව භාගයේ දී බුද්ධ ශාසනයේ ඇතිවී තිබුණු ශාසනික විලෝපනය සහ පසුගාමීත්වය නගාසිටුවීමට හැකි වූයේ ගණින්නාන්සේගේ මෙහෙවර නිසාය. එම ප්‍රබෝධය තුළින් දහඅට වැනි සියවසේ මැද භාගය වනවිට සරණංකර හිමියන්ගේ කැපවීම නිසා මෙරට බෞද්ධයන්ගේ සිත් සතන් සනසාලමින් ශාසනයේ දියුණුවක් ඇති වූ බව පැහැදිලි ය.[1] ශ්‍රී ලංකාවේ චිරකාලීනව පැවත ආ ආරණ්‍යක සම්ප්‍රදාය සොයා ගිය අතීත සම්ප්‍රදායේ ජීව බලවේග ඒකරාශී කරන උත්සාහයක් ලෙස උපසම්පදාව සැලකීමට හැකි වේ. මෙරට ශාසනයේ වර්ධනය මල්ඵල දැරුවේ ක්‍රි.ව. 1753 දී ය.[2] මෙම ලිපිය තුළින් දහ අට වැනි සියවසේ කන්ද උඩරට බෞද්ධාගමික පුනර්ජීවනයේ පරිහානියට සරණංකර සංඝරාජ හිමියන්ගේ භූමිකාව කොතෙක් දුරට බලපෑවා ද යන්න හඳුනාගෙන, ශ්‍යාම උපසම්පදාව තුළින් කුල ක්‍රමය ප්‍රචලිත වූ ආකාරය විග්‍රහකිරීමට අපෙක්ෂිත ය.

දහඅට වැනි සියවසේ කන්ද උඩරට රාජධානියේ ඇති වූ බෞද්ධ පුනර්ජීවනය පිළිබඳ කතිකාවේදී ඉදිරිපත්ව ඇති ප්‍රධාන අදහසක් නම් උපසම්පදාවෙන් පසු උඩරට ප්‍රදේශයේ බෞද්ධාගමික පසුබිම සරණංකර හිමියන් අපේක්ෂිත පරිදි දියුණු නොවූ බවයි. සංඝරාජ හිමි ගෙනගිය ආගමික ව්‍යාපාරයේ දිගුකාලීන ප්‍රතිඵල මතු වූයේ උඩරට ප්‍රදේශවලට වඩා පහතරට ප්‍රදේශවලිනි.[3] උපසම්පදාව ලබා සංඝරාජ ධුරයෙන් පිදුම් ලැබූ

---

සංස්: මැදවල නිමලසිරි හිමි, තෙලුල්ලේ ධම්මසිරි හිමි, "චරණ" පස්වන කලාපය, භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, 2013.

සරණංකර හිමියන්ට කිසිදු නීතිමය බාධාවකින් තොරව සාමයික හා සාමාජික සේවයෙහි යෙදීමට අවකාශ සැලසුණේ ය. එම ධුරයට පත්වීමත් සමග දළදා වහන්සේගේ භාරකාරත්වය ද ලැබුණේ ය.[4] එතුමා බෞද්ධාගමේ සෑම කටයුත්තකට ම සෘජු දායකත්වය ද ලබා දුන්නේ ය. නමුත් සරණංකර හිමියන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු නොවූයේ මන්ද යන්න විචාරශීලිව විමසිය යුතුය.

සසුනේ අභිවෘද්ධියට සංඝරාජ හිමියන් දිවි හිමියෙන් ක්‍රියා කළ ද උන්වහන්සේගේ ඇතැම් පක්ෂග්‍රාහි කටයුතු එහි පිරිහීමට ද බලපෑවේ ය. සංඝරාජ හිමියන් වශයෙන් එතුමා සෑම කෙනෙකුට ම එක සමානව නායකත්වය දිය යුතුය. එනමුත් මල්වතු විහාරයට වැඩි අනුග්‍රහයක් දැක්වීමත් සමග ඇතැම්හු ඊට විරුද්ධ වූහ.[5] මෙම විහාරය ප්‍රමුඛවීමට බලපෑ හේතු වූයේ උපසම්පදාව ගෙන ඒමට මූලිකව ක්‍රියා කළ සරණංකර හිමියන් එහි වාසය කිරීමත්, නාගරිකව පිහිටා තිබීමත්, මීට පෙර සිටම විදේශීය භික්ෂූන් පැමිණි විට ලැගුම් ගන්නා ස්ථානය වීම සහ රජ මාළිගාවට ආසන්නවීමත් යන කරුණු නිසා ය.[6] මෙම පක්ෂග්‍රාහි ප්‍රතිපත්තිය නිසා ඇතැම් භික්ෂූන් වහන්සේලා සංඝරාජ හිමියන්ගේ උපදෙස් පිළිපැදීමට අකමැති වූ බව පෙනේ. උපසම්පදාවෙන් අනතුරුව අස්ගිරිය සහ මල්වතු උභය විහාරීය භික්ෂූහු සරණංකර හිමියන්ගේ ක්‍රියාමාර්ග පිළිබඳ අකමැති වූහ. තවද දෙවෙහෙරේ අසමගිය ද වැඩි විය. මල්වත්තේ භික්ෂූන් අස්ගිරිය සුළු කොට තැකීම මෙහි ප්‍රධාන හේතුව වශයෙන් සැලකිය හැකිය. සඟරජ හිමියන් විහාර දෙකේ භික්ෂූන් රැස් කරවා අවවාද කොට ක්‍රියා කළත් සමගිය දීර්ඝ කාලයක් පැවතුණේ නැත. සඟරජ හිමියන් නොසලකා සෙසු භික්ෂූන් වහන්සේ ක්‍රියා කිරීම නිසා උඩරට ප්‍රදේශයේ බෞද්ධාගම පසුබෑමට ලක් විය. උභය විහාරයෙහි වෙන වෙනම සීමා මාලක ඇති නොකොට උපසම්පදා කර්මය සිදු කිරීමට අවශ්‍ය මගපෙන්වීම් ලබාදීමට සරණංකර හිමියන්ට ක්‍රියා කිරීමේ හැකියාව තිබෙන්නට ඇත. තවද මේ මූලස්ථාන දෙක එකක් කොට එය එක මහානායක ස්ථවිරයන් වහන්සේ නමක් යටතේ පාලනය වන්නට කටයුතු කළා නම් මෙබඳු වූ භේදයක් පැන නගින්නේ නැත. උන්වහන්සේට සංඝරාජ පදවිය

ලැබුණේ රාජබලයත් සමග ය. එම බලය නිසියාකාරයෙන් භාවිත කර කටයුතු කළේ නම් ගැටලු ඇතිවීමට පැවති ඉඩ ප්‍රස්තා අවම වීමට ඉඩ තිබුණි.

උපසම්පදාව ඇති කළ පමණින් ශාසන පරිහානිය වළක්වා ගත නොහැකි බව අවබෝධ කරගත් සරණංකර හිමියන් භික්ෂූන්ගේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා රාජ අණින් කතිකාවතක් ඇති කිරීමේ වටිනාකම රජුට අවබෝධ කර දුන්හ.[7] මේ අනුව "කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත" නමින් හැඳින්වෙන ව්‍යවස්ථා පද්ධතියක් රජතුමා විසින් සංඝරාජ හිමියන්ගේ සහයෝගයෙන් පනවන ලදී.[8] උන්වහන්සේගේ ශාසනික මෙහෙවරෙහි උච්චතම ඵලය ලෙස දැක්විය හැක්කේ මෙම කතිකාවත ය.[9] අතීතයේ සිදු වූ වැරදි වර්තමානයේ දී නිවැරදි කර ගැනීම සඳහාත්, අනාගතයේ දී එබඳු තත්ත්වයක් ඇති වීම වැළැක්වීම සඳහාත් කතිකාවත සිදු කළත් ඉන් හටගත් ප්‍රතිඵල උඩරට ප්‍රදේශයේ බුදුදහමේ පරිහානියට ඉවහල් වූ බව පෙනේ.

මෙම කතිකාවත සිදු කිරීමෙන් අනතුරුව සියම් නිකායේ උපසම්පන්න වීමට හැකි වූයේ ගොවිගම කුලයේ අයට පමණි. ගොවිගම කුලය හැර සෙසු කුලයන් පහත් කුල ලෙස සැලකීය. එලෙස සලකා කටයුතු කිරීම උඩරට බුදු සසුනේ පරිහානියට සෘජු වශයෙන් බලපෑවේය. මන්දාරම්පුර පුවතේ සඳහන් වන පහත ප්‍රකාශයෙන් සියම් නිකාය උසස් කුලයට පමණක් සීමා වීම තහවුරු වේ.

"...... ගොවි දනන් පමණක් ගෙන පැවිදි දෙනු ..... උභය විහාරය මේ මහ අරණ අකඩ නොකර වඩමින් ශාසන පිළිවෙත් පවිත්‍රාව රැක ගත යුතුමය. . . . . . ,"[10] එසේම එහි සඳහන් පහත පද්‍යවලින් ද ඒ බැව් සනාථ වේ.

නොයෙක් ගොත් ඇති යන
විදිය පවතින කෙලෙ සින
සිටි නම් පැවිදි ගෙන
උපසපන් උන් නොකර හළ මැන[11]

රජුගේ මෙම නියෝගයත් සමග සෙසු කුලවල භික්ෂූන් වහන්සේලා දැඩි විරෝධයක් දැක්වූහ. බුද්ධ කාලීන භාරතයෙදී එතෙක් පැවති සියලු කුල භේද දුරලා කටයුතු කිරීමට ගෞතම බුදුන් වහන්සේට හැකි විය. එහෙත් මහනුවර යුගයේ පැවිදි වීමට කුල භේදය සැලකීමේ ක්‍රියාවලිය තුළ සසුනේ ඉදිරි ගමනට බාධාවක් ද එල්ල විය. මෙම ක්‍රියාමාර්ගයට එරෙහිව භික්ෂූන් වහන්සේලා ඒකරාශී කිරීමට සීතාවක සහ මොරවක යන සාමණේර දෙනම ක්‍රියා කළහ.[12] නමුත් අවසානයේ ඔවුන්ට දඬුවම් විඳීමට පවා සිදු වූ බව පෙනේ. මෙලෙස උද්ගත වූ තත්ත්වයන් පාලනය කිරීමට සරණංකර හිමියන්ට හැකියාව තිබුණ ද එය උන්වහන්සේ අතින් ඉටු නොවූයේ ඇයි ද යන්න ගැටලුවකි. පසුකාලීනව වෙනත් නිකායන් බිහිවන අතර ඒ සඳහා යම් සහයෝගයක් උඩරට භික්ෂූන් වහන්සේගෙන් ලැබුණා ද යන්න සිතාබැලිය යුතුය. එම නිකායන් ආරම්භ කිරීමට පුරෝගාමී මෙහෙයක් ඉටු කරනු ලබන්නේ පහතරට භික්ෂු පරපුර විසිනි. දහනම වැනි සියවස තුළ පහතරට කේන්ද්‍රගතව ඇති වූ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය තුළ එම භික්ෂූන් වහන්සේගේ නායකත්වය ද කැපී පෙනේ.

මහනුවර රාජධානියේ අවසාන සමය වන විට පෙනීගිය කාරණයක් වන්නේ රදළවරුන්ගේ බලය වඩාත් වර්ධනය වූ බවකි. විශේෂයෙන් ම මෙම බලය වර්ධනය වීමට වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ වඩුග කුමාරිකාවක් විවාහ කරගැනීම ප්‍රධාන වශයෙන් බලපෑවේය. රාජ සභාව මෙම සිදුවීමත් සමග සිංහල සහ හින්දු වශයෙන් බෙදීමකට ලක් විය. ආචාර්ය ශ්‍රීමතී ලෝනා දේවරාජගේ උඩරට රාජධානිය නම් කෘතිය මගින් පෙන්වා දෙන්නේ උඩරට ශාසනික පුනරුද්දීප්තියක් ඇති නොවීම සඳහා පාරම්පරික රදළ බලය ඉවහල් වන්නට ඇති බවයි.[13] රජු සෑම විටම සිංහල රදළයන්ගේ බලය වර්ධනය වීම පිළිබඳව බිය විය. අසමගිය පවතින තාක් රජුගේ ශක්තිය වර්ධනය කරගත හැකි බව හෙතෙම හොඳින් අවබෝධ කරගෙන සිටියේ ය.[14] මහජනයා කෙරෙහි විශාල ප්‍රභුත්වයක් දැරූ සංඝයා පළමු තත්ත්වයට නගා සිටුවා, ගම් බිම් ලබාදී ශක්තිමත් කොට ඔවුන්ගේ සහයෝගය ඇතිව තම තත්ත්වය ආරක්ෂා කර ගැනීමට රජතුමා අපේක්ෂා

කළේය. සංඝයා ද ඔවුන් මගින් ජනතාව ද තම පක්ෂයට ගෙන උඩරට රදළ පන්තියේ බලය බිඳීමට ඔහු බලාපොරොත්තු විය. එවකට උඩරට සිටි ප්‍රභූ භික්ෂූන් වහන්සේ රදළ පවුල්වලට අයත් වූ නිසා එම අරමුණු එතරම් ම සාර්ථක නොවූ බවත් නොපෙනේ.

රජතුමා භික්ෂූන් සහ රදළයන් අතර බෙදීමක් අපේක්ෂා කළත් භික්ෂූන් සහ රදළවරු අතර පැවතියේ දැඩි සමීප ඥාති සබඳතාවකි. ඒ බව සනාථ කිරීම සඳහා නිදසුනක් ලෙස සරණංකර හිමියන්ගේ ඥාති පරපුර මදක් විමසා බැලිය හැක. මෙම හිමියන් වෙල්ලස්සේ දිසාපති සහ තුම්පනේ රටේ රාළ ලෙස කටයුතු කළ කුලතුංග මුදලි පරපුරෙන් පැවත එන අයෙකි.[15] තවද තිබ්බොටුවාවේ හිමියන් සමරක්කොඩි අදිකාරම්ගේ ඥාති සහෝදරයකු ලෙස උඩරට රාජධානිය කෘතිය මගින් පෙන්වා දෙයි. මේ අනුව පැහැදිලි වන්නේ ප්‍රධාන තනතුරු හෙබ වූ භික්ෂූන් වහන්සේ මගින් රදළ සමාජය ද නියෝජනය වූ බවයි. එය තවත් අතකින් රදළ බලය වර්ධනයට ද මහෝපකාරී විය. රාජසිංහ රජු කතිකාවත පිහිට වූයේ රදළ බලය වර්ධනය කිරීමේ අදහසින් නොවුණ ද එය නිරායාසයෙන් ම සිදු වූ බව පෙනේ. කෙසේ වුවත් අවසානයේ රජු සහ රදළවරු අතර ගැටීම උඩරට ප්‍රදේශයේ සසුනේ පරිහානියට හේතු වූ බව කිව හැකිය.

උඩරට ප්‍රදේශයේ බුදුදහමේ පරිහානියට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ ඇතැම් ආගමික ප්‍රතිපත්ති ද ඉවහල් විය. ඒ වනවිට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ බුද්ධාගමට තිබුණු ඇල්ම ගැන බෞද්ධයන් තුළ සැක පහළ වී තිබුණි.[16] ඔහු ශිව ආගමික පූජා විධි කෙරේද දැඩි ඇල්මක් දැක්වීය. සිය නළලෙහි අළු තවරාගෙන සිටි බවට රාජාවලියේ සඳහන් වේ. මෙම ක්‍රියාමාර්ග බෞද්ධ සම්ප්‍රදායට එරෙහිවීමක් ලෙස උඩරට ජනතාව කල්පනා කළේය. එබැවින් ක්‍රි.ව. 1760 දී රජුට එරෙහිව කුමන්ත්‍රණයක් දියත් කර ඇත. කුමන්ත්‍රණකරුවන් රජ හැඳින් වූයේ "දෙමළ මිථ්‍යා දෘෂ්ටිකයකු"[17] ලෙසු ය. මෙම කියමනෙන් ම පැහැදිලි වන්නේ උඩරට ජනතාවට බෞද්ධ රජෙකු සිංහාසනාරූඪ කිරීමට අවශ්‍ය වූ බවයි.

රජු බොරු වළකට දමා මැරවීමේ කුමන්ත්‍රණය මෙහෙයවීමේ මූලිකත්වය සමරක්කොඩි භාරගත් අතර සරණංකර සහ තිබ්බටුවාවේ යන හිමිවරුන්ගේ සහයෝගයත් රජගෙදර මුළුතැන්ගෙයි නිලධාරියකු වූ මොලදණ්ඩෙගේ සහයෝගයත් ලැබී ඇත.[18] කුමන්ත්‍රණයෙන් අපේක්ෂා කළේ රජු මරා සියම් දේශයෙන් ගෙන් වූ කම්ටි පිපට් සිංහාසනාරූඪ කරවීම යි.[19] මෙම කුමන්ත්‍රණය පිළිබඳ සඟරජුන් දැන සිටි බව ශාසනාවතීර්ණ වර්ණනාව නම් කෘතියේ සඳහන් වේ. ප්‍රධාන නායක භික්ෂූන් වහන්සේ ලෙස එය දැනගත් වහා ම එය නැවැත්වීමට හෝ එසේ නොමැති නම් රජුට දැන්වීමට අවස්ථාව තිබුණි. මෙම කුමන්ත්‍රණයට සඟරජු දායක වී ක්‍රියා කළේ ස්ථානෝචිත ප්‍රඥාව නොතිබුණ අයෙකු නිසා බැව් කොටගම වාචිස්සර හිමියෝ පෙන්වා දෙති. බෞද්ධාගම නගා සිටුවීමට රාජ අනුග්‍රහය ලබාදුන් රජු මැරීමට කුමන්ත්‍රණය කිරීම සඳහා සඟරජ හිමියන් මුල්වීම තුළින් පැහැදිලි වන්නේ උඩරට බුද්ධ ශාසනය සරණංකර යුගයේදී ම පරිහානියට පත්වීම වළක්වා ගැනීමට අපොහොසත් වූ බවයි. එපමණක් ද නොව මෙම කුමන්ත්‍රණයට සම්බන්ධ වූ රදළවරුන්ට මරණීය දණ්ඩනය ලබාදී ඇත. ඉන් නොනැවතුණු රජු තිබ්බටුවාවේ හා සරණංකර යන හිමිවරුන් තනතුරුවලින් පහකර සඟරජ හිමි කෙහෙල් ඇල්ලේ ද තිබ්බටුවාවේ හිමි බින්තැන්නේ ද සිරගත කර තැබුණි.[20] කුමන්ත්‍රණයට සම්බන්ධ සියලු භික්ෂූන් වහන්සේලා උඩරටින් නෙරපා ඇත. වැරදිකරුවන් ලෙස හඳුනාගත් භික්ෂූහු දුරබැහැර ප්‍රදේශවලට නෙරපනු ලැබුව ද ටික කලකට පසු නැවත රාජ ප්‍රසාදය ලක්වූහ. නමුත් මේ සිද්ධියෙන් හටගත් අඳුරු වලා පට උඩරට සසුනේ පරිහානියට ඉවහල් වන්නට ඇත. තවද පැන නැගුණා වූ මතභේද සහ අමනාපකම් ද දෙපාර්ශ්වය එකිනෙකාගෙන් ඈත් වීමට හේතු වූයේ ය. මෙය බුදු සසුනේ ඉදිරි ගමනට ඉමහත් බාධාවක් වූ බව ද සිතිය හැක. අභිනවයෙන් උඩරට සිහසුනට පත් රාජාධි රාජසිංහ රජුට පවා මේ තත්ත්වය නිසා ශාසනය ගොඩ නැගීමට හැකියාවක් නොවුණි. කෙසේ වුවත් කන්ද උඩරට ආර්ථික බලය අහිමි වූ රදළවරුන්ගේ හඬ මෙම කුමන්ත්‍රණය මගින් නිරූපණය වූ බව පෙනේ.

ක්‍රි.ව.1658 මෙරටට පැමිණි ලන්දේසි ජාතිකයෝ පහතරට ප්‍රදේශයේ බෞද්ධාගම විනාශ කිරීම සඳහා නොයෙක් ක්‍රියාමාර්ග ගත්හ. එම තත්ත්වය උඩරට සම්බන්ධයෙන් ද අනුගමනය කළේය. ක්‍රි.ව. 1760 ඇති වූ කුමන්ත්‍රණය ලන්දේසීන් දුටුවේ නායක්කාර්වරුන්ට විරුද්ධව උඩරට ඇති වූ කැරැල්ලක් වශයෙනි.[21] මෙම කුමන්ත්‍රණය පිළිබඳව මහාචාර්ය මහින්ද සෝමතිලකගේ අදහස වන්නේ ආර්ථික බලය අහිමිව කලකිරීමට පත්ව සිටි රදළයන් විසින් සැලසුම් කරන ලදුව කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මිත්‍යාදෘෂ්ටික බව ඉදිරිපත් කොට ප්‍රධාන භික්ෂූන් වහන්සේලා විසින් සහයෝගය ලබාදුන් බවය. තවද ක්‍රි.ව. 1766 වර්ෂයේදී උඩරට ප්‍රදේශවලට ලන්දේසි බලපෑම එල්ලවීමත් සමග ශාසනික පරිහානිය වේගවත් විය. ආර්ථික අරමුණු සපුරා ගැනීමේ අපේක්ෂාවෙන් උපසම්පදාව ගෙන ඒමට සහයෝගය ලබා දුන්න ද අනෙක් අතින් සසුන පරිහානියට ද බලපෑවේ ය.

මේ අනුව පැහැදිලි වන්නේ සංඝරජ හිමියන් ජීවත්ව සිටිය සමයේදී ම උඩරට භික්ෂු ශාසනයේ පරිහානිය පෙන්නුම් කළ බවකි. උඩරට ශාසනික පුනර්ජීවනය පසුගාමී වුවත් ඊට ප්‍රතිපක්ෂව පහතරට ප්‍රදේශවල ඇති වූ ශාසනික ප්‍රබෝධය ආගමික පුනර්ජීවනයට හේතු විය. උඩරට සියම් නිකාය හා බැඳි ආගමික සංවිධානය සාම්ප්‍රදායික සමාජ ආර්ථික රටාව තුළ සිර වූ අතර පහතරට නව අනුගාමිකයන් යටතේ එය නැවුම් මුහුණුවරකින් ව්‍යාප්ත වී ගියේ ය. උඩරට සාම්ප්‍රදායික සංඝ සංවිධානය බවට පත් වූ සියම් නිකායෙන් ඇති කෙරෙන සීමාවලින් නිදහස්වීමට නව නිකාය ආරම්භ කරමින් ඉදිරියට ඒමට හැකි වූ බව පෙනේ. පහතරට ගොවිගම නොවන කුලවලට අයත් ජනයා ස්වකීය ආගමික උරුමය ගෙන ගියාක් මෙන් ගොවිගම නොවන උඩරට බෞද්ධ ජනතාව ද උඩරට අමරපුර නිකාය පිහිටුවාගෙන භික්ෂූන් වහන්සේ ඇතිකරමින් ශාසනික කටයුතු ඉදිරියට ගෙන යාමට ඉදිරිපත් වූ බව පෙනේ.

ඉහත සඳහන් තොරතුරු තුළින් අනාවරණය වන්නේ සරණංකර සංඝරාජ යුගයේදී ම උඩරට ප්‍රදේශයේ බෞද්ධාගම

පරිහානියට පත්වූ බවයි. බෞද්ධාගමේ චිරජීවනය උදෙසා සියම් උපසම්පදාව පිහිටුවීම කාලෝචිත ය. පෙරටත් වඩා කුල භේදය උපසම්දාවට ඇතුළුවීම මෙම යුගයේ දී දැඩිව දක්නට ලැබුණි. ගෞතම බුදුරජාණන් වහන්සේ ද එතෙක් පැවති කුල භේදය නොසලකා කටයුතු කළ බව ශාසන ඉතිහාසයෙන් පැහැදිලි වේ. එම ධර්මයට අනුව යමින් ක්‍රියා කරන සංඝ සංස්ථාව කුල මත පදනම්ව කටයුතු කිරීම නූතනයේ පවා දක්නට ඇත. ඒ සඳහා යම් දායකත්වයක් ක්‍රි.ව. 1753 පිහිටවූ සියම් උපසම්පදාව මගින් ද බලපෑවේ ය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස මෙරටට සියමෙන් ආ උපාලි හිමියන්ගේ මූලිකත්වයෙන් මල්වත්තේ විසුංගාම සීමාවෙහි වැලිවිට සරණංකර හිමියන් ප්‍රමුඛ භික්ෂූන්ට උපසම්පදාව දීමෙන් ආරම්භ කරන ලද ශ්‍යාමෝපාලිවංශය[22] අංශ දෙකකට බෙදිණ. එනම් අස්ගිරිය පාර්ශ්වය සහ මල්වතු පාර්ශ්වය යනුවෙනි. ග්‍රාමවාසී සහ ආරණ්‍යවාසී භික්ෂු කණ්ඩායම් දෙක නියෝජනය කළ මෙම පිරිස් වෙන වෙනම උපසම්පදා පැවැත්වූහ. මේ කණ්ඩායම් දෙක අතර දිගින් දිගටම ගැටුම් පැවතුණු අතර ඒ ගැටුම්වලට බොහෝ දුරට පදනම් වූයේ සීමාසංකර වාදය යි. පසුව ප්‍රාදේශීයවාදය මත උඩරට හා පහතරට කොටස් අතර මතුවූ මතභේද නිසා කැලණි පාර්ශ්වය බිහිවිය. ක්‍රි.ව.1855 වෙසක් මාසයේ දි කෝට්ටේ රජමහා විහාරයට එක් වූ බෙන්තර අත්ථදස්සී ඇතුළු සංඝයා වහන්සේ ශ්‍රී කල්‍යාණ සාම ශ්‍රී ධර්ම සංඝ සභාව නමින් නිකායක් ආරම්භ කර කැලණි ගඟේ උදකුක්ඛෙප සීමාවේ දි 1855 මැයි 22 දින දි උපසම්පදා උත්සවයක් පවත්වමින් කැලණියේ දි සියම් නිකායේ කොටසක් වශයෙන් සංඝ සභාවක් ආරම්භ කළහ. කැලණි පාර්ශ්වයෙන් කැඩුණු කොටස ක්‍රි.ව.1862 කෝට්ටේ පාර්ශ්වය ලෙස වෙන් විය. මේ සඳහා නායකත්වය දුන්නේ පොතුවිල ඉන්ද්‍රජෝති හිමියන් ය. පසු කලක උඩරට සියම් නිකායික භික්ෂූන් ඌවේ ශ්‍යාමවංශික නිකාය වශයෙන් තවත් කොටසකට බෙදී ගිය බව පෙනේ.[23] ආරම්භක අවස්ථාවේ සිට ම මෙලෙස බෙදීමක් පැවතීම තුළින් අවබෝධ වන්නේ පසුකාලයේ බෙදීම් ඇතිවීම සාමාන්‍ය දෙයක් බවට පත්වන බවයි. විශේෂයෙන්

ම එදා පවත්වනු ලැබූ උපසම්පදාවේ දී ලංකාවේ නොයෙක් කුලවලට අයත් වූවෝ මහණව උපසම්පදාව ලැබූහ.[24] එය හොඳින් පැහැදිලි වන අවස්ථාවක් ලෙස සරණංකර හිමියන්ගේ දකුණත් සවූ ලෙස ක්‍රියා කළ සිට්නාමළුවේ හිමියන් දුරාවේ කුලයට අයත් වූ අතර මුල්කිරිගල පරපුරේ ආරම්භකයා ද එවැන්නෙක් යැයි ඇතමුන්ගේ මතයක් පවතී.[25] නමුත් සිට්නාමළුවේ හිමියන් දුරාවේ කුලයට ද වේහැල්ලේ හිමියන් නැකති කුලයට අයත් වූ වග පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ ප්‍රකාශ කරති. දෙවරගම්පල සිල්වත් තැන සිත්තර කුලයට හෙවත් ආචාරි කුලයට අයත් වූ වග සිතිය හැකිය.[26] මෙම සිද්ධියෙන් අනාවරණය වන්නේ මුල් කාලය තුළ කුල භේද නොලසකා ක්‍රියා කර ඇති බවකි. නමුත් එය කල් යත්ම එකම කුලයකට පමණක් සීමා විය. එය උඩරට භික්ෂූන් තුළ ද විද්‍යමානව පවතී.[27]

සංඝ ශාසනයේ ඇති වූ නව ප්‍රබෝධය සමග කීර්ති ශ්‍රී රාජසිංහ රජු අපේක්ෂා නොකළ සමාජ ප්‍රතිඵල ද ජනිත විය.[28] කුල ක්‍රමය දේශීය සාම්ප්‍රදායික සමාජ සංවිධානයේ සැකිල්ල විය. කුල ක්‍රමයේ ප්‍රමුඛතම තලයේ සිටි ගොවිගම කුලය දේශපාලන, සමාජ හා ආර්ථික ආධිපත්‍යය දැරිය.[29] මේ තුළින් අවබෝධ වන්නේ උඩරට සමාජ ධුරාවලියේ ගොවි වංශික රදළ කොටස් ඉදිරියෙන් සිටි බවකි.[30] සමාජ සංවිධානයේ වැදගත් ආයතනයක් වූ සංඝ සංවිධානය ද මේ රටාවට ඇතුළත් වී සිටියේය. එනිසා ගොවිගම කුලයේ ඒකාධිකාරයට සංඝ සංවිධානය හසුවී තිබුණි. මුහුදුබඩ ප්‍රදේශය මුලින් ම යටත්විජිත ආධිපත්‍යයට නතු වීම නිසා කාලයක් සමග ඇතිවන සමාජ, ආර්ථික වෙනස්කම් මත මේ රටාව පරිණාමයට ලක් විය. විශේෂයෙන් ම පහතරටට එල්ල වූ විදේශීය බලපෑම නිසා ගොවිගම, කරාවේ, දුරාවේ, සලාගම සහ නවන්දන්නා කුලවලට අයිති පිරිස වඩාත් පෙරමුණට පැමිණියහ.[31] මෙම යුගයේ ඒ ඒ කුල පාලනය සඳහා වෙන වෙනම සංවිධාන පැවති නිසා ප්‍රමුඛතාව සඳහා ගැටුමක් ද නොවූ බව පෙනේ. මෙම තත්ත්වය තුළ විවිධ කුල පිරිස් පැවිදි බිම් [illegible], උඩරට කරා පැමිණ උපසම්පදාව ලබා ගත්හ.

නමුත් මෙම තත්ත්වය කීර්ති ශ්‍රී රාජසිංහ සමය තුළදීම යම් යම් වෙනස්වීම්වලට භාජනය විය. මෙකල ආධිපත්‍යය හිමිකරගෙන සිටි භික්ෂූන් සියම් නිකායේ මහණවීම ගොවි කුලයට පමණක් සීමා කළේ පහත් කුලවල අය මහණ වී සංඝ සමාජයේ වැදගත් තැන් ලැබීම වැළැක්වීමට යැයි සිතිය හැකිය. උපසම්පන්න භික්ෂූන් වහන්සේලා අනුගමනය කළ භික්ෂුත්වයට නොගැළපෙන ක්‍රියාමාර්ග කිහිපයක් මන්දාරම්පුර පුවතේ දක්වා ඇත. පැවිදිව සිටි සමහර හීන ජනයා ප්‍රභූන් දුටු විට, ගිහි කල පුරුදුව සිටි පරිදි සිවුර ගලවා ඉණ වෙලා ගෙන ඔවුන්ගේ පා වැඳ සිටිති යි රජුට දන්වන ලදී.[32] ඇතැම් කුල හීන භික්ෂූන් නැටීම, බෙර වැයීම වැනි කුලය හා සම්බන්ධ කටයුතුවල නිරත වන බවද ගිහි සමයේ තමාට නියමිත වෘත්තීන්වල නිරත වූ බව ද පෙනේ. ලබුගම ලංකානන්ද හිමියන් විසින් සංස්කරණය කළ මන්දාරම්පුර පුවතේ ප්‍රස්තාවනාවේ මෙසේ සඳහන් වේ.

> "...හෙරණ පැවිදි තැනත් දොහොත් මුදුන්දි නිරිඳු වැඳ දෙයියෝ බුදුවත්ට අපගේ ස්වාමිදරුවන් දැක පස්වා දහසක් දිනේවා කියමින් වැඳ ආවැඩු බව සැබෑව කියා සැල කළා ම රජ බොහෝ සංවේගයට පැමිණ... හෙරණ තැනත් දවුල් බැඳ නටන පුවතකුත් සැලවී ඒ සැබෑව දැයි විචාළ කල ශිෂ්‍ය දරුවන් සඳහා පිණිස දවුල ගැසූ බව සැබවයි කීවාය..."[33]

ඉහත විස්තරයෙන් එවකට භික්ෂුවගේ ස්වභාවය මැනවින් අවබෝධ වේ. දිනක් රජු මහියංගණයට පැමිණි පසු හෙරණුවන් කිහිපදෙනෙකු රජුට නමස්කාර කොට ඇත. රජුට නමස්කාර කිරීම සඳහා එම භික්ෂූන් යොමු කරවීමට ඇතැම් නායක භික්ෂූන් වහන්සේලා පෙලඹ වූ බව ජනප්‍රවාදවල සඳහන් වේ. හීන කුලවල ජනතාව ද සමාජයේ ගෞරවාදරයට පත්වීම වැළැක්වීම සඳහා ඔවුන් එසේ සිදුකරවන්නට ඇත. එනමුත් මෙම සිදුවීමෙන් රජු අතිශයින් කලකිරීමට පත්ව තිබේ. එම භික්ෂූන් එසේ හැසිරීමට හේතු වූ කරුණු පිරික්සීමේදී නායකහිමිවරුන් විසින් දි පෙන්වා ඇත්තේ සිල්වත් සමාගමට ඇතුළත් ව මහණ උපසම්පදාව

ලැබූ කුලහීනයන් එසේ හැසිරෙන බවකි. එම කටයුතු පාලනය කිරීම සඳහා උතුම් ගොත් එනම් ගොවි කුලයේ අයට පමණක් උපසම්පදාව දෙන ලෙස රජු නායක හිමිවරුන්ගෙන් ඉල්ලා සිටියේ යැයි කියනු ලැබේ.[34] ගොවිගම කුලයට පමණක් පැවිදි උපසම්පදාව දීම පිළිබඳ මන්දාරම්පුර පුවතේ මෙසේ සඳහන් වේ.

මෙම උභය වෙහෙ රා
ඇති තෙක් සසුන ඉඳු රා
මෙ විදි අත් නොහැර රා
වඩනු යෙහෙමුණි සසුන් පව රා [35]

මෙවන් සිදුවීම් නිසා සමාජයේ සෙසු කුලයන්ට දැඩි ප්‍රහාරයක් එල්ල විය. මහණ වූ කුල හීනයන් මුළු ජීවිත කාලය තුළ සාමණේර වශයෙන් සිටින අතර දිවයිනේ උපසම්පන්න භික්ෂූන් හැම දෙනම ගොවි කුලයට අයත්වීම හා ලාභ ප්‍රයෝජන ලබාගෙන ප්‍රබල තනතුරු සියල්ල ම ඔවුන්ට හිමිකර ගැනීමක් ද දක්නට ලැබේ. රජු රාජ නියෝගයක් ලෙස පැනවුවත් කරුණුකාරණා නිවැරදිව අවබෝධකර දී බෙදීම් ඇතිවීම වැළැක්වීමට සරණංකර හිමියන්ට හැකියාව තිබුණි. එසේ නොකර නායක භික්ෂූන් විසින් රජු ලවා හිතුවක්කාර ලෙස මෙම නීතිය පනවන ලද්දේ යැයි සිතිය හැකි ය. තවදුරටත් එදා සිදු වූ කුල බෙදීම අද වන විටත් වෙනස් කළ නොහැකි තත්ත්වයට පත්ව ඇත.

මහණ වීමට පෙර සහ පසු සසුනේ පිළිවෙත් පිළිබඳ අවබෝධයක් නායක හිමිවරුන්ට ලබාදීමට හැකියාව තිබුණි. කුලය පාදක කරගෙන පැවිද්ද දීම තුළින් සිදු වූයේ පතිත රිළවුන්ට ඉණිමං බැඳීමක් බව කොටගම වාචිස්සර හිමියෝ පෙන්වා දෙති.[36] සංඝරාජ හිමියන්ගේ අනුදැනුම ඇතිව පිහිට වූ කතිකාවත මගින්ද උදා වූයේ අනපේක්ෂිත ප්‍රතිඵල ය. මහාචාර්ය සුරවීර සඳහන් කරන්නේ " මෙම පනත සත්‍යයක් නම් මෙවැනි ව්‍යවස්ථාවක් පනවන ලද්දේ එදා පැවති තත්ත්වයට තාවකාලික පිළියමක් වශයෙන් විය යුතු බවයි." එනමුත් එය ක්‍රියාත්මක වූයේ වෙනත් ආකාරයකට ය.[37] සියම් උපසම්පදාව ගොවිගම කුලයට පමණක් සීමා වූ අතර අනෙක් සියලුම කුල පහත් කුල ලෙස

සැලකිණි. ක්‍රි.ව.1765 නිකුත් කළ කතිකාවත පරිදි උපසම්පදාව අස්ගිරි, මල්වතු, උපෝසථාගාරවලදී පමණක් ලබාදිය යුතු විය. අන් ස්ථානවලදී උපසම්පදාව ලැබුණේ නුවරට කැඳවා "යටත් පිරිසෙන් තෙරුණු නමක් ඇතුළු වූ සෙසු උපයුක්ත සංඝයා මධ්‍යයෙහි ජාති ගෝත්‍ර විචාර . . . කුල දෝෂයක් ක්‍රියා දෝෂයක් නැතැයි දන්නා සඟ කෙනෙකුන් ප්‍රතිඥා කොට මහණ කරවිය යුතුයි"[38] යනුවෙන් රජු නියෝග කරන ලදී. එසේ පහත් කුලවලට උපසම්පදාව දීමට එරෙහිව කළ නියෝගයට සමාජය තුළ විරෝධයක් හටගත්තේය. විශේෂයෙන් ම පැනවූ කතිකාවතට එරෙහිව විරෝධය පෑම සඳහා සීතාවක සහ මොරවක යන සාමණේරවරුන් ක්‍රියා කළත් අවසානයේ ඔවුන්ට සිදුවුයේ දඬුවම් විඳීමට ය. එහිදි මූලිකත්වය ගෙන ක්‍රියා කළ පිරිස සහ ප්‍රමුඛ වූ භික්ෂූන් වහන්සේලා දෙතිස්නමක් යාපනයට පිටුවහල් කර තිබේ.[39] නමුත් මෙවැනි තත්ත්වයක් වැළැක්වීමට ප්‍රධාන සංඝයා වහන්සේට හැකියාව තිබුණ ද ඔවුහු මුනිවත රක්කහ. මෙම යුගයේ කුලය කොපමණ තදින් බලපෑවා ද කිවහොත් සරණංකර හිමිපාණන්ගෙ ශිෂ්‍යයෙකු වූ අඹගහපිටියේ ඥානවිමල තිස්ස හිමියන්ට උඩරට සියම් නිකායේ උපසම්පදාව අහිමි වූයේ එතුමා සලාගම කුලයට අයත්වූ නිසාය.[40] තම ශිෂ්‍යයන් පවා අමතක කිරීමට සරණංකර හිමියන් පෙලඹුණු බව මින් ගම්‍ය වේ.

මහත් අභිමානයෙන් සහ ගෞරවයකින් යුතුව උඩරට සියම් උපසම්පදාව සිදු කර නොබෝ කලක් යාමට පෙර ගැටලු හටගත්තේය. ක්‍රි.ව. 1782 දී පමණ වගේගොඩ ධම්මකුසල නම් පහතරට භික්ෂුවක විසින් ලියන ලද රාජ සංදේශයෙහි ගැහැනුන් හා එක්ව පවුල් කමින්, දරුවන් හදමින්, කුඹුරු කොටමින්, ඔිලන්ද කාරයන්ට කුකුල් මස් හා බිත්තර විකුණන බෞද්ධ භික්ෂූන් සිටි බව සඳහන් වේ.[41] ක්‍රි.ව.1826 අවුරුද්දේ දී යටන්වල සිරි සුනන්ද නම් අස්ගිරි පාර්ශ්වයේ මහානායක හිමියන් විසින් ලියන ලද "සීමා සංකර විනෝදනී" නම් කෘතියෙහි මල්වතු විහාරයෙහි දෙනු ලබන උපසම්පදාව ගැන සැක පහළ කර තිබේ.[42] පාරිශුද්ධභාවයට පත් සියම් නිකායේ සන්සුන් බව වැඩි කලක් නොපැවති බවත්, ආරවුල් වර්ධනය වී භේදභින්න හටගත් බව ඒ අනුව පෙනේ.

මේ අතර වැලිවිට සංඝරාජ හිමියන් ඇසුරේ අධ්‍යාපනය ලබා රාජ නියෝගය නිසා උපසම්පදාව ලැබීමට නොහැකි වූ පිරිස් වෙනත් රටකින් උපසම්පදාව ලබා ගැනීමට කතිකා කළහ. විශේෂයෙන් ම උඩරට පහතරට භේදයට වඩා දුරදිග ගිය කුලභේදය මත සියම් නිකායෙන් වෙන් වූ භික්ෂු කණ්ඩායම් ගණනාවක් අමරපුර සහ රාමඤ්ඤ නිකායන් පිහිටුවාගෙන වෙන් වූහ. මෙසේ සිංහල බෞද්ධ සමාජය බෙදී වෙන්වී යාමට හේතු වූයේ මල්වතු විහාරයේ පැවති අගතිගාමී පරමාධිපත්‍යය ද බව කිව හැකිය. සියම් නිකාය හුදු ගොවිගම කුලයට ම සීමාකර තැබීමට ගත් ප්‍රයත්නයට ප්‍රහාරයක් එල්ල කරමින් මාදම්පාගම, කොස්ගොඩ, බ්‍රාහ්මණවත්ත, බෝගහවත්ත, වතුරගම සහ අඹගහපිටිය යන සාමණේරවරු ද උපාසකයන් තිදෙනෙක් ද බුරුමයට ගොස් එහිදී උපසම්පදාව ලැබ ලංකාවට පැමිණියහ. අඹගහපිටියේ ඤාණවිමල භික්ෂූන් වහන්සේ විසින් ක්‍රි.ව. 1803 වෙසක් පොහෝ දින බලපිටියේ මාදුගඟේ උදකුක්ඛෙප සීමාවෙහිදී සාමණේරයන්ට උපසම්පදාව දෙමින් අමරපුර නිකාය ආරම්භ කරන ලදී. පසුව අමරපුර නිකාය දඹුල්ල ශාඛාව, කල්‍යාණ වංශික නිකාය, ශ්‍රී ධර්මරක්ඛිත නිකාය, සබරගමු නිකාය, උඩරට නිකාය, ඌව නිකාය වශයෙන් කොටස් ගණනාවකට බෙදී ගියේ ය. මින් ඇතැම් කොටස් කුලය මුල්කරගෙන ආරම්භ වුවත්, පසුව විවිධ කුල නියෝජනයන් එක් එක් ශාඛාව තුළ ඒකරාශී වූ බව පෙනේ. සීමාසංකරවාදය මුල් කරගෙන අමරපුර සද්ධම්මවංශික නිකාය පිහිටුවීමෙන් පසු අමරපුර නිකාය මූලික වශයෙන් කොටස් දෙකකට බෙදී ගියේය. එම නව පාර්ශ්ව බිහි වූ පසු සෙසු කොටස් මෙයින් වෙන්ව හඳුනාගැනීම සඳහා අමරපුර මූලවංශික නිකාය යැයි නම් කර ගත්බව පෙනේ.[43]

කුලය පදනම් කරගෙන ආරම්භ වූ නිකාය භේදය තවදුරටත් වර්ධනය වූ ආකාරයක් පෙනේ. ක්‍රි.ව. 1823 දි සියම් නිකායික භික්ෂුවක ලෙස උපසම්පදාව ලබා සිටි පසුව, අස්ගිරිය සහ මල්වත්ත අතර ඇතිවූ ආරවුල නිසා එයින් කලකිරී, සියමයට ගොස් රාමඤ්ඤ රටෙහි පහළ සියමෙහි වෙනම වැඩෙමින් තිබුණු ධම්මයුක්තික නිකායෙහි 1844 දි උපසම්පදාව ලැබ 1853දී

ලංකාවට පැමිණ, මාතලේ කුඹියන්ගොඩ දී 1864 ජූනි 12 ව දින නව රාමඤ්ඤ නිකාය පිහිටුවන ලදී.[44] සියම් නිකාය පිහිටුවා නොබෝ කලක් ගතවීමට පෙර ලංකා සමාජයේ කුලය පදනම් කරගත් නිකාය බිහිවීම සමාජයේ ඉදිරි පැවැත්මට යම් බාධාවක් වූ බවද පෙනේ. එසේම දහනම වැනි සියවසේ දි ඉංග්‍රීසි යටත්විජිත පාලන කාලයේ කුල අතර වූ තරගය ලක්දිව බුදු සසුන කෙරෙහි ද නොමඳව බලපෑවේය.

ගිහි හෝ පැවිදි හෝ පාර්ශ්වයන් තුළින් වැරදි සිදුවීමට ඇති ඉඩප්‍රස්ථා බොහෝ ය. සියම් උපසම්පදාව පිහිටුවා කෙටි කලකින් අස්ගිරිය හා මල්වතු පාර්ශ්වයන් අතර උද්ගත වූ භේදය නොබෝ කලකින් කුලවලට ද බලපෑවේ ය. එදා සියම් උපසම්පදාව ලැබූ පහත් කුලවල පිරිස් ඉහත සාකච්ඡා කළ පරිදි ක්‍රියා කරන්නට ඇත්තේ ඔවුන් බණ දහම් නො දත් නිසා මිස කුලයට අයත් රාජකාරිය එය නොවූ නිසාය.[45] පැවිදි කිරීමට පෙර සසුන තුළ හැසිරිය යුතු ආකාරය වගකීම් සහිත ප්‍රධාන භික්ෂූන් වහන්සේලා විසින් අවබෝධකරදීමේ හැකියාව තිබුණි. පිළිවෙත් නොදත් විදේශිකයෙකු වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජුට ද ඒ පිළිබඳ අවබෝධයක් ලබාදීමට හැකියාව තිබුණි. එනමුත් එසේ නො කර බුදුන්වහන්සේ පවා අනුමත නොකළ කුල භේදය සසුන තුළ ව්‍යාප්ත කිරීමට සරණංකර හිමියන් ප්‍රමුඛ ප්‍රභූ භික්ෂූන්ගේ ක්‍රියාකාරිත්වය නිතැතින් හේතු වූ බව කිව හැකිය. කුල වාදයෙන් ඉදිමුණු මාන්නය මහණකමට නුසුදුසු දෙයක් බවට කොටගම වාචිස්සර හිමියෝ පෙන්වා දෙති.[46] මහනුවර යුගයේ දී ගොවිගම කුලයේ අයට පමණක් පැවිදි උපසම්පදාව ලබාදීමෙන් සිදු වූයේ බුද්ධාගම පිළිබඳ වගකීම සීමා සහිත පිරිසක් අතට පත්වීමකි. කෙසේ වුවත් නිකාය පදනම් කරගනිමින් ව්‍යාප්ත වූ බෙදීම නූතන බුදුදහමේ වර්ධනයට ද සෘජුව බලපෑවේ ය. නමුත් ගෞතම බුදුන් වහන්සේ විසින් පහාරාද සූත්‍රයේ මෙසේ පෙන්වා තිබේ. "යම් සේ ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන ගංගා ගලා ගොස් මුහුදට වැටුණු කල ඒවායේ තුබූ නම් අතුරුදන් වී මහා සමුද්‍රය එකම ව්‍යවහාරයට පැමිණේ ද එසේ ම බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන නා නා ජාතික නා නා ගෝත්‍රික ජනයා

මාගේ මේ ශාසනයෙහි පැවිදි ව පළමුව තුබූ නම් ගොත් සියල්ල අතහැර එකම ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ යන ව්‍යවහාරයට පැමිණෙති. මෙය මාගේ ශාසනයෙහි පවත්නා සතරවන ආශ්චර්ය අද්භූත කාරණය ද වේ.[47] ගෞතම බුදුන්වහන්සේ තුළ එවැනි දැක්මක් පැවතුණත් මහනුවර යුගයේදී එම තත්ත්වය මුළුමනින්ම වෙනස් වූ බව පෙනේ.

## ආන්තික සටහන්


1 හේමපාල විජයවර්ධන, සහ පී.බී. මීගස්කුඹුර, සියම් ශ්‍රී ලංකා ආගමික සම්බන්ධතා, (18 වන සියවස) ප්‍රස්තාවනාව, XL1 ප්‍රදීප ප්‍රකාශන, කොළඹ, 1993.

2 එම, XL1.

3 ශ්‍රියානි ගුණරත්න, "දහතමවන සියවසේ සංඝ සංවිධානයේ නව නිකායන්ගේ වර්ධනය තුළ ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ විකාශය," ඥාණෝපායනී විශේෂ කලාප, අංක 2, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 2002, පිටු. 48.

4 ලබුගම ලංකානන්ද, සංස්. මන්දාරම්පුර පුවත, කොළඹ, අභය මුද්‍රණාලය, 1959, කවි. 818- 819.

5 කුඹුල්ලේ සීලක්ඛන්ධ, අස්ගිරි මහාවිහාරයේ ප්‍රභවය, විකාශය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, මාලිගාකන්ද, 1997, පිටු .147.

6 එම, පිටු 147.

7 මංගල ඉලංගසිංහ, රාජ්‍යය සහ ආගම, කැලණි විශ්වවිද්‍යාල මුද්‍රණාලය, මොරටුව, වර්ෂය නැත , පිටු. 23.

8 ඒ. වී. සුරවීර, සිංහල කතිකාවත් භික්ෂු සමාජය, සංගරා, එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1971, පිටු. 22 - 27.

9 එම, පිටු. 26 -151.

10 මන්දාරම්පුර පුවත, පිටු. 15.

11 එම, කවි. 860 පි. 107.

12 මන්දාරම්පුර පුවත, කවි. 883 - 864.

13 ශ්‍රීමතී ලෝනා දේවරාජ, උඩරට රාජධානිය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පාදුක්ක, 1997, පිටු. 136.

14 එම. පිටු. 138.

15 හේනේපිටගෙදර, පියනන්ද, සංඝරාජ සාධු චරියාව, රත්න පොත් ප්‍රකාශකයෝ 1969. පිටු. 14.

16 එච්.ටී බස්නායක, ශ්‍රී ලංකා ශිෂ්ටාචාරය III, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, 2002, පිටු. 168.

17 පී.වී.බී, සෝමරත්න, ටිකිරි අබේසිංහ, සහ ශ්‍රීමති ලෝනා දේවරාජ, උඩරට රාජධානිය, 1470- 1818, ලේක් හවුස් ඉන්වෙස්මන්ට් සමාගම, කොළඹ, 1977.පිටු.79.

18 උඩරට රාජධානිය, 1470- 1818 , එම, පිටු. 79.

19 එස්.එම්. ජයරත්න සහ ඒ.එල්. ජයරත්න පිණ්ඩපාතික වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණෝ සහ ශ්‍යාමවර්ණතාව, නිපොන් ග්‍රැපික්ස්, කෙහෙල්වත්ත, 2001,පිටු. 26.

20 කිරිඇල්ලේ. ඤාණවිමල, සංස්. පූජාවලිය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1965. පිටු. 271.

21 උඩරට රාජධානිය 1470-1818, එම, පිටු, 80.

22 වේරගොඩ, අමරමෝලී, සංස්. නිකාය සංග්‍රහය, (ප්‍රකාශනය සඳහන් නෙවේ) 1955, පිටු. 47-53.

23 ශ්‍රී චාල්ස් ද සිල්වා. සංස්. මුංකොටුවෙ රාළ කළ සඟරජවත, එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1955,පිටු. 55.

24 කොටගම වාචිස්සර, සරණංකර සංඝරාජ සමය, විසිදුනු ප්‍රකාශන, 1960. පිටු 266- 267.

25 එම්.යු.ද. සිල්වා, ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය, අභය මුද්‍රණාලය, 1998, පිටු. 95-110.

26 පොල්වත්තේ, බුද්ධදත්ත, සම්පාතීයේ බෞද්ධාචාරියයෝ, එම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1964, පිටු. 4.

27 උඩරට රාජධානිය, පිටු. 138.

28 රැල්ප්, පීරිස්, සිංහල සමාජ සංවිධානය මහනුවර යුගය, බොරලැස්ගමුව, දෙවන මුද්‍රණය, 2001, පිටු. 05.

29 M.U. De Silva., "A review of Cast Condideration in the Public service by the Dutch and the British Officials in the maritime province of Sri Lanka up to 1850". Rohana I, P. 31-40.

30 ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය, පිටු. 103.

31 මන්දාරම්පුර පුවත, පද්‍ය, 832-35.

32 මන්දාරම්පුර පුවත, ප්‍රස්තාවනාව. XIII.

33 උඩරට රාජධානිය, පිටු. 139.

34 සරණංකර සංඝරාජ සමය, පිටු. 267.

35 මන්දාරම්පුර පුවත, කවි. 860 - 865.

36 එමXIII – XV.

37 සිංහල කතිකාවත් සහ භික්ෂු සමාජය, පිටු. 48.

38 මන්දාරම්පුර පුවත, XIII – XV.

39 එම, XIII – XV.

40 ප.බ.ජී. හේවාවසම්, මාතර යුගයේ සාහිත්‍යධරයන් සහ සාහිත්‍ය නිබන්ධන, පිටු. 96.

41 තිස්ස කාරියවසම්, රාමඤ්ඤ නිකායේ ප්‍රභවය හා ව්‍යාප්තිය, පටිපදා, 1997, පිටු. 02.

42 එම, පිටු. 02.

43 තිස්ස කාරියවසම්,"රාමඤ්ඤ නිකායේ ප්‍රභවය හා ව්‍යාප්තිය," පූජ්‍ය හේන්පිටගෙදර ඤාණසීහ මාහිමියන් වහන්සේලාට පිරිනැමෙන අභිස්තව සංග්‍රහය, 1987,පිටු. 15.

44 එම ,පිටු. 15- 20.

45 සරණංකර සංඝරාජ සමය, පිටු. 267.

46 එම, පිටු. 51.

47 අංගුත්තර නිකාය, පඤ්චම භාගය, අට්ඨක නවක නිපාතය, පහාරද සූත්‍රය, ශ්‍රී ලංකා ජනරජය, 1977, පිටු. 82-93.